

අතිගරු ජනාධිපති

මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ

# ගුවන් සේවා සියවස් සැමරුම් දින කථාව

අද ශ්‍රී ලංකා ගුවන් සේවා කර්මාන්තයට සියවසක් සම්පූර්ණවීමේ උත්සවය තමයි අපි මේ පවත්වන්නෙ. අපේ පියංකර ඇමතිතුමා කිව්ව වගේ නියමුවකු සහිත ගුවන් යානයක් මුලින්ම සාර්ථකව ගුවන් ගත කෙරුවෙ රයිට් සහෝදරයො. වැඩි කාලයක් යන්න ඉස්සර ගුවන් යානයක් ලංකාවටත් ගෙනාව. ලංකාවට නම් ඉතින් ගුවන් යානයක් ගෙනාවහම ඒ තරම් පුදුම වෙන්නෙ නැතුව ඇති. මොකද ඒ කාලෙ හිටපු අය අවුරුදු සියයකට උඩදි ඒ ගැන අහල තිබුණ හින්ද. ඒ අර ඇමතිතුමනි, ඔබ කිව්ව කතාව රාවණ රජ්ජුගෙ දඬුමොනරය ගැන. ඒක අහපු අයට මේක අළුත් දෙයක් වෙන්න බැහැ. කොහොම උනත් ලෝකෙ වගේම ලංකාවෙත් ප්‍රවාහන කටයුතු වල විශාල වෙනස්කම් රාශියක් ගුවන් යානය පැමිණෙවාත් එක්කම සිද්ධ වුනා. ඒක තමයි මිත්‍රවරුනි, ලංකාවට ගුවන් යානා එන්න කලින් අපි රට රට වලට ගියේ නැවෙන්. එදා හුඟක් අය නැවෙන් එහාට මෙහාට ගිය නිසා යුරෝපයේ ඉඳන් චීනයට නැව් ගියේ සේද මාවතේ තමයි. ඒ සේද මාවතේ තමයි අපි ඉන්නෙත්. නමුත් ගුවන් යානා ජනප්‍රිය වෙන්න වෙන්න මගීන් නැව් වලින් ගමන් යන එක නතර වුනා. හැබැයි එක යුගයක් තිබුණ බොහෝම සුබෝපබෝගී, හැමෝටම යන්න පුළුවන් දෙයක් නෙවෙයි මේක. සෑහෙන ගාණක් ගියා. දැන් ගණන් බලපුවාම දැන් ඒක තියන පහසුම, ලාභම ඉක්මන්ම ක්‍රමය බවට පත්වෙලා තියනව අපේ රටේ. විදේශ ශ්‍රමික ජනතාව මිලියන 02 ට ආසන්න පිරිසක් නැව් එනකන් බලන් ඉන්නෙ නෑ. ඒ කට්ටිය ඔක්කොම ගුවනින් යන්නෙ. ගුවනින් නොගිය කෙනෙක් අද හොයා ගන්නත් නෑ. මම හිතන්නෙ ගුවන් සේවයටත් විශාල ආදායමක් ලැබෙන්නෙ මේ අයගෙන්.

හාමුදුරුවනේ, ගුවන් යානය ලංකාවට ඇවිත් වසර 100 ක් ගතවුනත් අපේ රට ඒ ක්ෂේත්‍රය විශිෂ්ටත්වයට පත් කරන්න දැන්

තමයි අපි හිතන්න පටන් අරන් තියෙන්නෙ. එදා අපි ගුවන ගැන හිතුවෙ නෑ. අපේ කට්ටිය මුහුද ගැන හිතුවෙත් නෑ. මම හිතනව මේව අපි ඉතිහාසයේ කරපු වැරදි. අපි මේ අනාගත පරපුරට අපි විසින් කරන ලද වැරැද්දක් විදියට තමයි මම දකින්නේ. දේශපාලඥයින් විදියට මුලු රට වටේ මුහුද තිබුණත් අපි මුහුද ජයගන්න හිතුවෙ නෑ. ඒ දවස් වල මුහුදෙ ගියා අපි. නමුත් එදා ඉඳලම ලංකාවෙ විදේශ වෙළඳාම් වාසිය ගත්තෙ හුඟක් වෙලාවට අරාබි, චීන ජාතිකයො කියල අපි දැකල තියනව. ඒක තමයි පරංගි, ලන්දේසි සහ ඉංග්‍රීසින් අපේ රට ආක්‍රමණය කරල වාසිය ගත්තෙ. මම හිතන්නෙ එකපාරක් විතරක් අපි ගිහිල්ල මියන්මාරය ආක්‍රමණය කළා. මම පහුගිය දවසෙ බුරුමයට ගිය වෙලාවෙ එහෙ ඉතිහාසයෙ කියවෙනවා අපේ අය ගිහිල්ල සමූල ඝාතනය වෙච්ච කතාවක්. එහෙම වුනේ අපි ඒ කාලෙ අහස ගැන හිතපු නැති නිසා. අපිට එක කාලයක් ඇවිල්ල පරිප්පු දානකොටත් අපි උඩ බලාගෙන හිටිය. අහස ජයගන්න අපි හිතල තිබුණ නම් අපේ හිටපු මිත්‍රයො එහෙම ලේසියෙන් උඩින් ඇවිල්ල පරිප්පු දාන්න බෑ. එදා අපිට දෙවන ලෝක යුද්ධෙදි ජපන්නු ඇවිල්ල කොළඹටත් බෝම්බ දැම්ම. ජපන්නු බෝම්බ දැම්මට කමක් නෑ ඊට පස්සෙ කොටිත් ඇවිල්ල බෝම්බ දැම්ම පහුගිය ඊයෙ පෙරේද. ඒ අවුරුදු තුනකට කලින් අපේ ස්වාධීනත්වය නැති වෙලා ගිය හැටි.

අපි එතනින් අපි මේ ගැන හිතන්න කාලය ඇවිල්ලා. අපිට හිතුන ගමන් එකපාරටම හාමුදුරුවනේ විකුණුව අපේ එකම ගුවන් සමාගමයි තිබ්බේ. ඒ සමාගමත් විකුණුව ජාවාරම් කාරයින්ට. ඒකේ ප්‍රතිපලය මොකද්ද මට හදිස්සියට, රාජ්‍ය නායකයට ජනාධිපතිවරයා වශයෙන් මට කොළඹට එන්න ඕනෑ වුනාම, එංගලන්තේ ඉඳල ගිය ගුවන් යානය ආපහු එන්න ටිකට් දෙන්න බෑ කිව්වා. මේ බලන්න මොන තරම් අපේ ලංකාව, ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ලොකුවට ගහලා තියෙනවා. එත් ඒකේ රටේ නායකයාට එන්න බෑ. ඕනනම් ඔයාට විතරක් එන්න දෙන්නම් නෝනට යන්නත් බෑ. ඒ අය හොඳටම දන්නවා එතකොට යන්නේ නැහැ කියල. මේ අපි, මම විඳපු අත්දැකීම්. අපිට එදා යාන්තම් මිහින් ලංකා හදලා තිබුණ හින්දා ඒක එහෙට ගෙන්නගෙන ඒකේ නැගලා තමා මම ආවේ. ඒ නිසා ලංකාවේ මුහුද ගැනත් ඒ වගේම අහස ගැනත් බරලපතල විදිහට හිතන්න ඕනේ. ඒක හිතුව එකම චින්තනය මහින්ද චින්තනය විතරයි. ඒක අපි පැහැදිලිව මහින්ද චින්තනයේ සඳහන් කරලා තියෙනවා නිල් ගුවන ජය ගනිමු කියලා. ගුවන් ක්ෂේත්‍රය ජයගන්න හිතුවේ අපි. ඒක හින්දා තමයි අපි කුණු කොල්ලයට විකුණලා තිබුණ එයාර් ලංකා ගුවන් සමාගම ආණ්ඩුවට ජනතාව අතරට ගත්තේ ආපහු නොදී. ඒක හින්දා තමයි අපි ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් එක එහෙම තියෙන්නේ. ඒක අද ආදායම් උපයන ආයතනයක් වෙලා.

අපි මහින්ද චින්තනයෙන් සඳහන් කරන පංච මහා ක්ෂේත්‍ර කේන්ද්‍ර වලින් ගුවන් කේන්ද්‍රය විශේෂ තැනක් ගන්නේ. ඒ හින්දා තමයි අපි ජාත්‍යන්තර ගුවන් තොටුපළක් හදලා පහුගිය කාලේ මම හිතන්නේ වසර කීයක් විතර වෙනවද? පනහක් විතර වෙනවා. ඒකත් මම හිතන්නේ සුද්දා හදපු එක මුලින්ම නේද? ඒක අපි ගත්තේ නොවැම්බර් පලවෙනිදා තමයි අපි අපිට ආපහු පවර ගත්තේ ඊට පස්සේ තමයි 63 දී කැනඩාවත් එක්ක සම්බන්ධ වෙලා මේ ගුවන් තොටුපළ වැඩිදියුණු කළේ. බණ්ඩාරනායක මැතිණිය විසින්. මම හිතන්නේ හැබැයි අවුරුදු 50 කට පස්සේ තමයි නව ගුවන් තොටුපළක් හදන්න අපි හිතන්න පටන් ගත්තේ. බලන්න මීට දශක තුන හතරකට කලින් අපි හිතුවනම් කටුනායක වගේම තවත් එකක්

අපි පැහැදිලිව මහින්ද චින්තනයේ සඳහන් කරලා තියෙනවා නිල් ගුවන ජය ගනිමු කියලා. ගුවන් ක්ෂේත්‍රය ජයගන්න හිතුවේ අපි. ඒක හින්දා තමයි අපි කුණු කොල්ලයට විකුණලා තිබුණ එයාර් ලංකා ගුවන් සමාගම ආණ්ඩුවට ජනතාව අතරට ගත්තේ ආපහු නොදී. ඒක හින්දා තමයි අපි ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් එක එහෙම තියෙන්නේ. ඒක අද ආදායම් උපයන ආයතනයක් වෙලා.

මේ රටේ තියෙන්න ඕනේ, හදන්න ඕනේ, කියල හිතලා ඒ සඳහා කටයුතු කළා නම් අපිට මේ සිංගප්පූරුව ගැන ඩුබායි ගැන නෙදර්ලන්තය වගේ රටවල් දැන් ලබාගෙන තියෙන දියුණුව ගැන හූල්ල හූල්ල ඉන්න ඕනේ නැහැ. ඒක අපිටත් ලබා ගන්න පුළුවන්කම තිබුනා. අපේ ඇමතිතුමා කිව්වා මේක මත්තල අපි හැදුව. ඒක ලබන මාර්තු මස වෙනකොට විවෘත කරනවා.

අපි ඒ වගේම බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ දකුණු ආසියාවේ තියෙන ප්‍රධාන ගුවන් තොටුපළ බවට පත් කරන්න අවශ්‍ය වැඩ පිළිවෙල හදන්න ඕනේ. ඒක හදනවා. ඒක දියුණු කල යුතුව තියෙනවා ඒක අපි දියුණු කරනවා. අපි දන්නවා මේ ගුවන් තොටට කොටි ඇවිල්ලා ගැහුවා. එතකොට කිව්වා ලංකාවේ සංචාරය එච්චර හොඳ නෑ කියලා. අනාරක්ෂිතයි කියලා තමයි කිව්වේ. ඒක ලෝකේ

ප්‍රචාරය වුනා. ඒක නමුත් අද වෙද්දී ඒක වෙනස් වෙලා දැන් ජාත්‍යන්තරය වෙන විදියකින් තමයි ඒක දකින්නෙ. මම සඟරාවක දැක්ක ලංකාවට දැන් අළුත් තත්වයක් ඇවිල්ලා. එදා අනාරක්ෂිත අපේ එයාර්ලයින් දැන් අනාරක්ෂිතයි කියලා කියන්නේ නෑ. ආරක්ෂාව හා නිරුපද්‍රිතතාවය අතින් අපි ආසියාවේ පළවෙනි තැනට අපි පත්වෙලා තියෙනවා. මේකට අපි ස්තුතිවන්ත වෙනවා පාලකයින්ට රජයේ අනුග්‍රහය වගකීම අපි නිසි පරිදි ඉටු කරන හින්දා. මේ වගේ කැපවීමකින් දැක්මකින් වැඩ කළොත් ලෝකයේ හොඳම ගුවන් සේවාවන් 10 අතරට යන්නට වැඩි කලක් යන්නේ නෑ කියලයි මම විශ්වාස කරන්නේ.

ඇමතිතුමා කිව්වා වගේ පොළවේ පිහටුවලා තියන ගගන නාවික ක්‍රම වලින් ඈත් වෙලා චන්ද්‍රිකා තාක්ෂණයට පිම්මක් අපි පනින්න ඕන. අපි ඒ පිම්ම පනින්න ඕන නම් ගුවන් සේවාව පිළිබඳ දැනුම ඇති විශිෂ්ටයන් බිහි කරන්න ඕන. දරුවනේ, දුවේ, පුතේ, අපි ඒ වගේම තොරතුරු තාක්ෂණ විෂය ක්ෂේත්‍රය ගැන අවධානය යොමු කරන්න ඕන. මේ අයට එහෙම වුනොත් තමයි අපිට අවශ්‍ය වන මෘදුකාංග ලෝකයට සපයන්න පුළුවන් වෙන්නේ. ඒ නිසා දශක පහක් මේ රටේ ගුවන් සේවය ලබපු ජයග්‍රහණ වලට වඩා පසුගිය අවුරුදු හතේ අපේ උදා කළ ජයග්‍රහණය වැඩියි කියලා අපි විශ්වාස කරනවා. අපි මේ කරන්නේ වසර දහස් ගණන් අතඇර දමා තිබූ ලෝකයක් ලංකාවට ලඟා කරලා දෙන්න උත්සහ කරන එක. ජාතියක් හැටියට අපි දුප්පත් මානසිකත්වයෙන් මිදෙන්න ඕන. මේක අපි මග හරවමු. පෙන්නන්න ඕන අපි හැම වෙලාවෙම සමහරු අපි දුප්පත් මානසිකත්වයෙන් ඉන්නේ. අපේ ජාතිය ගළවා ගන්න ගුවනේ වගේම සාගරයේ ඇති කරන්න සංවර්ධනය තුළින් පුළුවන්. මේ ක්ෂේත්‍ර සංවර්ධනය කිරීමෙන් අපට පුළුවන් ඒ මානසිකත්වයෙන් මිදෙන්න. අපි අපේ දරුවන්ට බත් දෙන්නේ අහසත් සයුරත් දියුණු කරල තමයි. අපි මේ අනාගත පරපුරට මේ රටේ ජනතාවට මේ රට බත් දෙන්නේ කියන එකත් අපි මතක් කරන්න කැමතියි.

**ඒ වගේම අපේ දරුවො වෛද්‍යවරු, ඉංජිනේරුවො, සුපර්ස්ටාර්ස්ල වෙන්න වගේම දැන් දැන් අහස ජයගන්නත් හිතල තියනවා, හැබැයි අපේ ගම් වල හුඟක් දෙනෙක් දන්නේ නැහැ ගුවන් නියමුවෙක් වෙන්න මොකක්ද කළ යුත්තෙ කියල, මේවා සමහර වෙලාවට අර ඉහළ පැලැන්තියකට නැත්නම් සල්ලි තියන මිනිස්සුන්ට දරුවන්ට විතරක් කියල, ගමේ කොල්ලට, කෙල්ලට වගේම ඒවා කාටත් උරුම කරන්න ඕන. ඒක නිසා මේ තත්වය වෙනස් කරල අපි අපේ රට අපි ආඩම්බර වෙන්න ඕන ඒ කාලෙ ගුවන් හමුදාවෙ ක්‍රියාත්මක වුනේ ගමෙන් ආපු කෙල්ලො, කොල්ලො, උන් ගමෙන් ආපු දරුවො. ඒ නිසා අපේ දරුවන්ටත් මහපොළව වගේ තවත් ලෝකයක් තියන බව පෙන්වන්න ඕන, මේ අහසත් සයුරත් ජයගන්න ඕන. ගුවන් යානා ක්ෂේත්‍රයට ඊළඟ සියවස උදාවෙන්න ඕන අහස ජයගන්න තරුණ දරුවන් පෙරටු කරගෙනයි කියල මා දැඩිසේ විශ්වාස කරනවා. මගේ ප්‍රාර්ථනයත් එයයි.**
**ඔබට සුභ අනාගතයක්........!**

